නානාට්ටාන් ප්‍රාදේශීය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය

-------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශ

----------------

1.1 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

--------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2014 මාර්තු 31 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 11 දින ඉදිරිපත් කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 24 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයෙහි සඳහන් කරුණු වලින් මූල්‍ය ප්‍රකාශයන්ට වන බලපෑම හැර 2013 දෙසැම්බර් 31 දින නානාට්ටාන් ප්‍රාදේශීය සභාවේ වැඩකටයුතු වල තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු සම්මත ගිණුම්කරණ මූලධර්මයන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

-----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදි අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

(ආ) ආදායම් සහ වියදම් සඳහා ලෙජර ගිණුම් පවත්වා නොතිබුණි. ජර්නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

------------------------------------------

ස්ථාවර තැන්පත් ලේඛණයක් නොමැති වීම නිසා 2013 දෙසැම්බර් 31 දිනට වු රු.10,500,000 ක් වු ස්ථාවර තැන්පතු ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම

-------------------

නීති රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවූ පහත සඳහන් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි වලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා (මුල්‍ය සහ පරිපාලන ) රිති - 1988 | | |
| රීති අංක 5(xii) | - | මුදල් සහ ගබඩා ආදිය භාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ප්‍රමාවත් ආරක්ෂක ඇප ලබාගැනීම සභාපතිවරයා විසින් සනාථ කර නොතිබුණි. |
| රීති අංක 218 | - | වර්ෂය අවසානයේ ඉඩම් සහ ගොඩනැගිලි සමීක්ෂණයට භාජනය කර නොතිබුණි. |
| (ආ) ශ්‍රි ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| මුදල් රෙගුලාසි 571 | - | 2013 දෙසැම්බර් 31 දිනට රු.736,595 ක් වු කල් ඉකුත් වු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | අංක 438 හා 2009 නොවැම්බර් 13 දින දරන රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛය | - | 2013 වර්ෂය සඳහා වූ සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ භාවිතා කළ නොහැකි ලෙස දක්වා තිබූ ගබඩා විෂයයන් 82 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | <u>ආයතන සංග්‍රහය</u><br>xxiv පරිච්ඡේදයේ 4 වගන්තිය | - | මාරු වී ගිය හෝ මියගිය/විශ්‍රාම ගිය/තනතුරු හැරගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.11,248 ක් වූ ණය අයකර ගෙන නොතිබුණි. |
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන පරිපාටිය - 2006<br>----------------------------------<br>111 පරිච්ඡේදයේ 3.4.3 වගන්තිය | - | වාර්ෂික සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදුකර නොතිබුණි. |

1.3.4 අධිකාරි බලය නොලත් ගනුදෙනු
--------------------------------------

2013 වර්ෂය සඳහා සංග්‍රහ වියදම් සඳහා රු.70,000 ක් වෙන්කර තිබුණි. නමුත් සභාව විසින් අධිකාර බලයක් රහිතව රු.236,760 ක් වැයකර තිබුණි.

2. මුල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මුල්‍ය ප්‍රතිඵල
-----------------

ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශ අනුව සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම් අතිරික්තය රු.3,695,832 ක් වූ අතර එයට එරෙහිව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු.2,668,012 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

--------------------------------------------------------------

සභාපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| වරිපණම් සහ බදු | 790,000 | 141,300 | - |
| බදුකුලි | 3,031,740 | 6,278,311 | 1,235,827 |
| බලපත්‍ර ගාස්තු | 495,500 | 414,670 | - |
| සේවා ගාස්තු | 2,599,600 | 2,096,629 | - |
| වරෙන්තු ගාස්තු, දඩ සහ අධිභාර | 35,000 | 72,545 | 63,000 |
| වෙනත් | 1,639,200 | 1,667,953 | - |
| එකතුව | 8,590,540 | 10,671,408 | 1,298,827 |

2.2.2 උසාවි දඩ

---------------

2013 දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් අයවිය යුතු උසාවි දඩ ප්‍රමාණය රු.63,000 ක් විය.

2.2.3 අයවිය යුතු ආදායම්

-----------------------

2013 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී මස්කඩ කුලී සහ බදු ප්‍රමාණය රු.542,452 ක් වූ අතර මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.1,771,480 ක් වූ හඳුනා නොගත් අත්තිකාරම් ශේෂ 2011 වර්ෂයේ සිට අඛණ්ඩවම ගිණුම් වල දක්වා තිබුණි. මෙය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදි මන්නාරම නගර සභාව විසින් පරිත්‍යාග කරන ලද ගලි බවුසරය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.2 අවිධිමත් ගනුදෙනු

---------------------

පහත සඳහන් අවිධිමත් ගනුදෙනු නිරීක්ෂණය විය.

(අ) සංස්කෘතික ශාලාව සඳහා විදුලි භාණ්ඩ මිළදී ගැනීමේදි අවම මිළ ගණන වෙනුවට උපරිම මිළ ගණන පිළිගැනීම නිසා සභාවට රු.12,525 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ආ) සංස්කෘතික ශාලාව සඳහා රු.322,500 කට තණකොළ , මල් පැල ආදිය මිළදි ගෙන තිබුණි. එම විෂයයන් සැපයු ආයතනය නමට චෙක්පත ලියනු වෙනුවට සභාවේ කාර්මික නිලධාරියා නමින් චෙක්පත ලියා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

සංස්කෘතික සභාවේ මුළු පිරිවැය ඇස්තමේන්තුව රු.34,274,176 ක් විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙහි 3:1 සහ 3:2 හි 20(i) වැනි පරිශිෂ්ඨය ප්‍රකාරව ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සීමාව රු.මිලියන 25 කි. එම නිසා ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව මුදල් ප්‍රමාණය රු.මිලියන 25 කට සීමා කිරීමට තීරණය කර තිබුණි. කෙසේ වුවද, ඉතිරි මුදල සභා අරමුදලෙන් වැය කර තිබුණි.

විදුලි පංකා මිළදී ගැනීම

-----------------------------

සවිකර තිබුණු විදුලි පංකා ඇණවුමෙහි සඳහන් පංකා වලට වඩා පහළ තත්ත්වයේ ඒවා විය. මේ සම්බන්ධයෙන් වැඩිපුර වැය කළ මුදල රු.172,950 කි.

3.4 අභ්‍යන්තර විගණනය

----------------------------

ආයතනය විසින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

4. පද්ධති සහ පාලන

---------------------

පහත සඳහන් පද්ධති සහ පාලන ක්ෂෙත්‍රයන් සම්බන්ධයෙන් සභාවේ විශේෂ අවධානය යොමුවිය යුතුය.

i. ගිණුම්කරණය
ii. මූල්‍ය පාලනය
iii. ආදායම්